# කිරිදෙනුන් පස් දෙනෙකුගෙන් යුත් මැදරට ප්‍රදේශයේ ගවගාලක් සඳහා වියදම් සැලැස්මක්

ශ්‍රී ලංකා ජාත්‍යන්තර සංවර්ධන සංගමය මගින් ක්‍රියාත්මක වන කිරි පට්ටි සංවර්ධන ව්‍යාපාරය යටතේ ණය මුදල් ලබාගැනීමට බලාපොරොත්තු වන අයෙකුට ප්‍රයෝජනවත් වන වියදම් පිළිබඳ සැලැස්මක්, මෙම ව්‍යාපාරයේ කාර්මික අධ්‍යක්ෂ ඊ. ඩී. එස්. පිල්ලෙයි මහතා විසින් සකස්කර ඇත. මෙහි සඳහන් වනුයේ 1975 සැප්තැම්බර් මාසයේදී ප්‍රකාශණයට පත්කරන ලද එම සැලැස්මෙන් උපුටා ගන්නා ලද්දකි.

කිරි දෙනුන් පස් දෙනෙකු සඳහා අක්කර 4 ක තණ වගාකරන්නේ යයිද, දෙනුන්ට තණ කපාදීම කරන්නේ යයිද මෙහිදී සලකනු ලැබේ.

මෙම වියදම් සැලැස්ම අනුව මුල් වර්ෂ දෙක තුල ආයෝජනය කළ යුතු මුදල රු. 17,600.00 කි. ඉන් මුල් වර්ෂය තුලදී ආයෝජනය කළයුතු මුදල වන රු. 13,600.00 මුදලින් රු. 2,000.00 ක්ම තණ වගාකිරීම සඳහා අක්කරයකට රු. 500 බැගින් අක්කර 4 සහනාධාර වශයෙන් ලැබෙනු ඇත. (මෙම සහනාධාර ක්‍රමය යටතේ තණ වගා කිරීම සඳහා නිසරු බිමක් සඳහා අක්. 1 කට රු. 500 ක්ද, නිසරු තේ හෝ රබර් අක්. 1 ක් සඳහා රු. 600 ක්ද, පොල් ඉඩම් අක්කරයක් සඳහා රු. 300 ක්ද සපයනු ඇත.) උපකරණ සහ ජල සම්පාදනය සඳහා අයිතිකරුට රු. 2,000 ක් වියදම් කිරීමට සිදුවනු ඇත. මේ අනුව ඉතිරි රු. 9,600 (එළදෙනුන් තුන්දෙනෙකු සඳහා රු. 6,000 ගොඩනැගිලි සඳහා රු. 2,800 සහ තණ නිෂ්පාදන වියදමෙන් කොටසක් පියවීමට රු. 800) දිගුකාලීන ගෙවීමේ ක්‍රමයක් යටතේ බැංකුවෙන් ණයට ලබාගත යුතුය.

දෙවන අවුරුද්දේදී තවත් එළදෙනුන් දෙදෙනෙකු මිලදී ගැනීම සඳහා, දිගුකාලීන ණය ගෙවීමේ ක්‍රමයට රු. 4,000 ක බැංකු ණය මුදලක් ලබාගත යුතුය. මේ අනුව වර්ෂ දෙක සඳහා මුළු බැංකු ණය මුදල රු. 13,600 කි.

කිරි විකිණීමෙන් ලැබෙන මුදල ගණනය කිරීමේදී වර්ෂයකදී කිරි දෙනෙකුගෙන් කිරි පයින්ට් 3,000 ක සාමාන්‍ය නිෂ්පාදනයක් ඇතැයි සලකනු ලබන අතර පයින්ට් එකක මිල ශත 90 ක් ලෙසද සලකනු ලැබේ.

කම්කරුවන් සඳහා මුදලක් මෙහි ඇතුලත් කර නොමැත්තේ, මෙම ඒකකය පාලනය කිරීම පවුලේ ශ්‍රමය මගින් කෙරෙන්නේ යයි සලකන බැවිනි.

මෙම ව්‍යාපාරයේ අය-වැය සම්බන්ධ පහත සඳහන් චක්‍රයක් දෙස බැලීමේදී, කිරි දෙනුන් ඇතිකිරීම ඉතා ලාභදායක බව ඔබට පෙනී යනු ඇත. තුන්වැනි අවුරුද්දේ සිට රු. 500 ක මාසික ආදායමක් ඔබට ලබාගැනීමට හැකිවනු ඇත. පස සාරවත් කිරීමෙන් හා වඩාත් කාර්යක්ෂම ලෙස තණ නිෂ්පාදනය කිරීමෙන්, මෙම ඒකකයට කිරි දෙනුන් 8 දෙනෙකුගෙන් සහ ආදේශක රැළක් අඩංගු කළ හැකි අතර එමගින් මාසික ආදායම රු. 850 දක්වා ඉහළ යනු ඇත. මේ අනුව අක්කරයක් සඳහා වාර්ෂික මූලධන හා ශ්‍රම යෙදුම් සඳහා ලැබෙන ආදායම රු. 2,500 ක් වනු ඇත.

කිරි දෙනුන් සඳහා රක්ෂණ ක්‍රමයක් කෘෂි-රක්ෂණ මණ්ඩලය මගින් අරඹා ඇත. අවුරුදු 2 - 10 අතර වයස් වූ දෙනුන්ගේ වටිනාකමින් 3% ක් වාර මුදල් වශයෙන් ගෙවීමෙන් ඔවුන් රක්ෂණය කළ හැක. කිරි පට්ටි සංවර්ධන ව්‍යාපාරය යටතේ ලබා ගන්නා ණය මුදලින් මිලයට ගන්නා සියලුම කිරි දෙනුන් මේ ක්‍රමය යටතේ අනිවාර්යයෙන් රක්ෂණය කළ යුතුව ඇත.

## මූල ධන ආයෝජනයන්

| | | ඒකකය | | වියදම | | | වර්ෂය 1 | | වර්ෂය 2 | | මුළු මුදල |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. ශ. | | | රු. ශ. | | රු. ශ. | | රු. ශ. |
| 1. | තණ බිම් සංවර්ධනය* | ... | අක්කරය | ... 700 0 | අක්. 4 | ... | 2,800 0 | ... | — | ... | 2,800 0 |
| 2. | ගොඩනැගිලි | ... | අක්. ගොඩනැගිලි | 400 0 | ගොඩ.නැ. 7 | ... | 2,800 0 | ... | — | ... | 2,800 0 |
| 3. | එළ දෙනුන් ... | ... | අක්. සතුන් | ... 2,000 0 | සතුන් 3 | ... | 600 0 | ... | 2: 4,000 0 | ... | 10,000 0 |
| 4. | ජල සම්පාදනය† | ... | ගොවිපල | ... 1,500 0 | 1 | ... | 1,500 0 | ... | — | ... | 1,500 0 |
| 5. | උපකරණ‡ | ... | ගොවිපල | ... 500 0 | — | ... | 500 0 | ... | — | ... | 500 0 |
| | | | | | | | 13,600 0 | | 4,000 0 | | 17,600 0 |

| * තණ බිම් සංවර්ධනය | රු. ශ. |
|---|---|
| ඉඩම් ගෙලි පෙහෙලි කිරීම ... ... | 200 0 |
| සිටුවීම ආදිය ... ... | 100 0 |
| පොහොර ... ... ... | 400 0 |
| | 700 0 |

† ජල සම්පාදනය—පයිප්ප සහ වතුර ටැංකි සඳහා වියදම ඇතුල්වේ.

‡ උපකරණ—පනිවටු, කිරි බාල්දි, ආදී සඳහා වියදම ඇතුල්වේ.

## විකුනුම් සහ නඩත්තු වියදම්

| විකුනුම් | වර්ෂය 1 | 2 | 3 | 4 | 5 | 6–20 |
|---|---|---|---|---|---|---|
| | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | |
| 1. කිරි විකිණීම ... | 4,860 0 | 8,840 0 | 10,800 0 | 10,800 0 | 10,800 0 | 10,800 0 |
| 2. වසු පැටවුන් විකිණීම | 100 0 | 200 0 | 200 0 | 200 0 | 200 0 | 200 0 |
| 3. රැලෙන් ඉවත් කරන දෙනුන් ... | — | — | — | 1,000 0 | — | 1,000 0 |
| 4. අතිරේක නැම්බියන් | — | — | 1,000 0 | — | 1,000 0 | — |
| මුළු | 4,960 0 | 8,840 0 | 12,000 0 | 12,000 0 | 12,000 0 | 12,000 0 |

**නඩත්තු වියදම්**

| | 1 | 2 | 3 | 4 | 5 | 6–20 |
|---|---|---|---|---|---|---|
| 5. කම්කරුවන් ... | — | — | — | — | — | — |
| 6. සාන්ද්‍ර ආහාර ... | 1,200 0 | 2,400 0 | 3,000 0 | 3,000 0 | 3,000 0 | 3,000 0 |
| 7. තණබිම් නඩත්තුව | — | 1,600 0 | 1,600 0 | 1,600 0 | 1,600 0 | 1,600 0 |
| 8. ගොඩනැගිලි නඩත්තුව | 250 0 | 250 0 | 250 0 | 250 0 | 250 0 | 350 0 |
| 9. කෘත්‍රිම සිංචනය සහ රෝග මර්දනය | 100 0 | 250 0 | 250 0 | 250 0 | 250 0 | 250 0 |
| 10. රක්ෂණය ... | 100 0 | 300 0 | 300 0 | 300 0 | 300 0 | 300 0 |
| මුළු | 1,650 0 | 4,800 0 | 5,400 0 | 5,400 0 | 5,400 0 | 5,400 0 |

1. කිරි පයින්ට් 1 ක් ශත -/90 ක් බැගින්.
2. පිරිමි වසු පැටවකු රු. 100/- ක් බැගින්.
3. එකකු රු. 1,000/- ක් බැගින්.
4. එකකු රු. 1,000/- ක් බැගින්.
5. පවුලේ ශ්‍රමය පමණි.
6. ටොන් 1 කට රු. 600/- ක් බැගින්.
7. අක්කර 1 කට රු. 400/- ක් බැගින්.
8. ගොඩනැගිලි සඳහා 5% ක් සහ උපකරණ සඳහා 20% ක් බැගින්.
9. එළදෙනෙකුට රු. 50 ක් බැගින්.

## ආය—වැය

| ආය මුදල් | | වර්ෂය 1 | 2 | 3 | 4 | 5 | 6–20 |
|---|---|---|---|---|---|---|---|
| | | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| විකුණුම් ... | ... | 4,960 0 | ... 8,840 0 | ... 12,000 0 | ... 12,000 0 | ... 12,000 0 | ... 12,000 0 |
| සහනාධාර ... | ... | 2,000 0 | ... — | ... — | ... — | ... — | ... — |
| බැංකු ණය ... | ... | 9,600 0 | ... 4,000 0 | ... — | ... — | ... — | ... — |
| අයිතිකරු විසින් කරන මුදල් ආයෝජනය ... | ... | 2,000 0 | ... — | ... — | ... — | ... — | ... — |
| මුළු | ... | 18,560 0 | 12,840 0 | 12,000 0 | 12,000 0 | 12,000 0 | 12,000 0 |

| වැය මුදල් | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| නඩත්තු වියදම් ... | ... | 1,650 0 | ... 4,800 0 | ... 5,400 0 | ... 5,400 0 | ... 5,400 0 | ... 5,400 0 |
| ආයෝජනයන් ... | ... | 13,600 0 | ... 4,000 0 | ... — | ... — | ... — | ... — |
| මුළු | ... | 15,250 0 | 8,800 0 | 5,400 0 | 5,400 0 | 5,400 0 | 5,400 0 |
| වාර්ෂික මුදල් ඉතිරිය | ... | 3,410 0 | 4,040 0 | 6,600 0 | 6,600 0 | 6,600 0 | 6,600 0 |